සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

**1.** ආගම යන්න දක්වන 'Religion' නම් වචනයේ මූල භාෂා වන්නේ,
(1) ලතින්, ඉංග්‍රීසි, හා ඉතාලි ය.
(2) අරාබි, ලතින්, හා පෘතුගීසි ය.
(3) ස්පාඤ්ඤ, ප්‍රංශ, හා ජපන් ය.
(4) සංස්කෘත, පාලි, හා දෙමළ ය.
(5) පර්සියන්, තුර්කි, හා මැලේ ය.

**2.** පහත කරුණු සලකන්න.
A - සංස්කෘතිය යනු අභ්‍යන්තරයේ ප්‍රකාශය වේ; ශිෂ්ටාචාරය යනු බාහිර පෙනුමේ ප්‍රකාශය වේ.
B - සංස්කෘතිය වෙනස් නොවේ; ශිෂ්ටාචාරය වෙනස් වේ.
C - සංස්කෘතිය ලෞකික වේ; ශිෂ්ටාචාරය බටහිරකරණය වේ.
D - සංස්කෘතිය යන්න, චින්තනය හා හැඟීම් සමග සම්බන්ධ වූවකි; ශිෂ්ටාචාරය යන්න ශාස්ත්‍රීය කලා හා ඇවතුම් පැවතුම් සමග සම්බන්ධ වූවකි.
E - මිනිස් හැකියා හා නිපුණතා සංස්කෘතිය වේ; මිනිසා, භෞතික සම්පත්, කාලය යන තුනෙහි සංකලනය ශිෂ්ටාචාරය වේ.

මෙම කරුණු අතුරෙන් සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය යන දෙක අතර සම්බන්ධතාව දක්වන වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, B, D, E (3) A, B, E, D (4) A, C, B, D (5) A, C, D, E

**3.** ජාහිලියියා සමයේ 'අයියාමුල් අරාබ්' යනුවෙන් හැඳින්වූයේ
(1) ශෝක දින වේ.
(2) උත්සව දින වේ.
(3) කෑබා හි මිනිසුන් එක්රැස්වූ දින වේ.
(4) වෙළෙඳපොළ දින වේ.
(5) අරගල දින වේ.

**4.** මස්ජිද් වාස්තු විද්‍යාවට නිදසුනක් වන්නේ,
(1) නිලාමියියා ය.
(2) අල්හම්රා ය.
(3) තාජ්මහල් ය.
(4) කුබ්බතුස් සඛ්රා ය.
(5) කුව්වතුල් ඉස්ලාම් ය.

**5.** ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිළිබඳ පෙරදිග ගවේෂකයින්ගේ දැක්ම, අනුපිළිවෙළින් පිළිබිඹුවන වරණය තෝරන්න.
(1) ශිෂ්ටාචාරය → රජය → ආගම
(2) රජය → ආගම → ශිෂ්ටාචාරය
(3) ශිෂ්ටාචාරය → ආගම → රජය
(4) ආගම → රජය → ශිෂ්ටාචාරය
(5) රජය → ශිෂ්ටාචාරය → ආගම

Past Papers Wiki



6. සහීහුල් බුහාරි හි නම් සඳහන් ව ඇති, අල්කුර්ආනය කටපාඩම් කළ සහාබාවරුන් නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,
   (1) මුආද් බින් ජබල්, සෙයිද් බින් තාබිත්, උබෙයි බින් කඃබ් සහ අබුදර්දා (රළි) ය.
   (2) අබ්දුල්ලාහ් බින් මස්ඌද්, අබූසෙයිද්, අබුදර්දා සහ අලි (රළි) ය.
   (3) උබෙයි බින් කඃබ්, මුආද් බින් ජබල්, සෙයිද් බින් දාබිත් සහ උමර් (රළි) ය.
   (4) අබුදර්දා, සාලිම් බින් මඃකල්, උබෙයි බින් කඃබ් සහ අබූ හුරෛරා (රළි) ය.
   (5) අබ්දුල්ලාහ් බින් මස්ඌද්, මුආද් බින් ජබල්, සෙයිද් බින් සාබිත් සහ අබ්දුල්ලාහ් බින් උමර් (රළි) ය.

7. කිරාඅත්, නාසිහ් වල්මන්සූඛ්, සබබුන් නුසූල් ආදි කලාවන්හි නිපුණ සහාබාවරයා වන්නේ,
   (1) අබූ හුරෛරා (රළි) ය. (2) මුස්අබ් බින් උමෙයිර් (රළි) ය.
   (3) අබ්දුර් රහ්මාන් බින් අවුෆ් (රළි) ය. (4) සෙයිද් බින් දාබිත් (රළි) ය.
   (5) උස්මාන් බින් අෆ්ෆාන් (රළි) ය.

8. තන්ලීලුල් අන්කාම් යනුවෙන් හඳුන්වන්නේ
   (1) අල්කුර්ආනය පහළ කළ අනුපිළිවෙළ පැහැදිලි කිරීම ලෙස ය.
   (2) අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කළ අනුපිළිවෙළ පැහැදිලි කිරීම ලෙස ය.
   (3) අල්කුර්ආනය මගින් සම්පාදනය කළ නීතිවලට අදාළ හේතුව පැහැදිලි කිරීම ලෙස ය.
   (4) අල්කුර්ආන්හි නීති වාක්‍යයන් වර්ග කිරීමේ ක්‍රමය ලෙස ය.
   (5) අල්කුර්ආන්හි කිරාඅත් ක්‍රමය පැහැදිලි කිරීම ලෙස ය.

9. පහත වගුවෙහි දක්වා ඇති තොරතුරු සලකන්න.

| සහභාවරුන් | ගෞරව නාමය |
|---|---|
| (i) හුදෛෆතුල් යමානි (රළි) | A - සෛෆුල්ලාහ් |
| (ii) කාලිද් බින් වලීද් (රළි) | B - අමානුල් උම්මත් |
| (iii) උස්මාන් (රළි) | C - සාහිබුස්සිර් |
| (iv) බිලාල් (රළි) | D - ජාමිඋල් කුර්ආන් |
| (v) අබූ උබෙයිදා (රළි) | E - මුඅස්සින් අර්-රසූල් |

ඉහත දක්වා ඇති සහභාවරුන් හා ඔවුන්ට අදාළ විශේෂිත නාම නිවැරදිව ගැළපීමෙන් ලැබෙන අනුපිළිවෙළ සඳහන් වරණය තෝරන්න.
   (1) A, C, D, B, E (2) B, D, E, C, A (3) C, A, D, E, B
   (4) D, A, E, B, C (5) E, D, A, C, B

10. සෞන්දර්යට අදාළව 'සීනත්' යනු
   (1) සැරසිල්ල වේ. (2) ලස්සන වේ. (3) මෝස්තරය වේ.
   (4) ශෛලිය වේ. (5) අනුකරණය වේ.

11. රබ්බානියත් යනු
   (1) තාපස තත්ත්වයට පත්වීමයි.
   (2) සමාධි තත්ත්වයට පත්වීමයි.
   (3) චින්තනය හා ක්‍රියා සමෝධානය වීමයි.
   (4) චිත්ත ඒකාග්‍රතාව සහිත වීමයි.
   (5) නිර්වාණ තත්ත්වයට පත්වීමයි.

12. බුස්තාද් නගරය පිහිටා ඇති ප්‍රදේශය කුමක්ද?
   (1) ඩමස්කස් (2) කූෆා (3) ඊජිප්තුව
   (4) බග්ඩෑඩ් (5) සිරියාව

13. පහත කරුණු සලකන්න.

A - අල්ලාහ්ගේ දාත් හා සිෆාත් එකමය.
B - මහා පාපයක් කළ තැනැත්තා මූඃමින් නොවේ.
C - අල්කුර්ආන් මවන ලද්දකි.
D - අව්ලියාවරු කරාමත් සහිත අය වේ.
E - අල්ලාහ්ව පරලොවෙහි දී දැකිය නොහැකිය.
F - පාපිෂ්ඨයින් පරලොවෙහි දී ෂෆාඅතය මගින් ප්‍රයෝජන ලබන්නේය.

මේවායින් මුඃතසිලාවරුන්ගේ ප්‍රධාන ප්‍රතිපත්ති පමණක් සඳහන් වරණය තෝරන්න.

(1) A, B, C, E (2) A, B, D, E (3) A, B, D, F (4) B, C, D, F (5) B, D, E, F

14. පහත වගුවෙහි දක්වා ඇති තොරතුරු සලකන්න.

| තනතුර | කාර්යභාරය |
|---|---|
| (i) අන්තරංග තුරේ | A - ගමේ නායකත්වය |
| (ii) ලේකම් | B - රාජ්‍ය පාලනය/රාජධානි |
| (iii) මඩිගේ බද්ද | C - ඔටු සේනාව |
| (iv) ඔටු පන්තිය | D - වෛද්‍ය සේවය |
| (v) බෙහෙත්ගේ මුහන්දිරම් නිළමේ | E - වෙළෙඳාම |

ඉහත වගුවෙහි දක්වා ඇති තනතුරු සමග අදාළ කාර්යභාරය නිවැරදිව ගැළපූ විට ලැබෙන අනුපිළිවෙළ සඳහන් වරණය කුමක්ද?

(1) A, C, B, D, E (2) B, D, C, E, A (3) C, B, A, E, D
(4) E, A, B, C, D (5) E, A, C, B, D

15. අරාබියට පිළිම වන්දනාව හඳුන්වාදුන් පුද්ගලයා වන්නේ

(1) අස්වද් අන්සි ය. (2) මුසෙලමා ය.
(3) අම්රු බින් ලුහෙ ය. (4) සජා ය.
(5) දුලෙහා බින්ත් කුවෙලිද් ය.

16. පුරාතන ලංකාවට පැමිණ පදිංචි වූ ප්‍රධාන වාර්ගිකයින් වන්නේ,

(1) ආර්යයන්, ද්‍රවිඩයන්, සහ අරාබිවරුන් ය.
(2) ආර්යයන්, යුරෝපීයන්, සහ අරාබිවරුන් ය.
(3) පෘතුගීසින්, ද්‍රවිඩයන්, සහ අරාබිවරුන් ය.
(4) ආර්යයන්, ලන්දේසීන්, සහ අරාබිවරුන් ය.
(5) යුරෝපීයන්, ලන්දේසීන්, සහ අරාබිවරුන් ය.

17. නබි (සල්) තුමාණන්ගේ කාලයේ හදීස් ආරක්ෂා කිරීමට යොදාගත් පිළිවෙතක් **නොවන්නේ**

(1) කටපාඩම් කිරීම ය. (2) ග්‍රන්ථාරූඪ කිරීම ය.
(3) ලියා තැබීම ය. (4) ක්‍රියාවෙහි යෙදවීම ය.
(5) ඔවුනොවුන් අතර බෙදාහදාගැනීම ය.

PAST PAPERS WIKI

18. අසබියියා නම් වචනයේ අර්ථයක් **නොවන්නේ** කුමක් ද?

(1) වාර්ගික ඥාතිත්වය රැකීම
(2) ජාහිලියියා සමාජ ව්‍යුහය
(3) සාමාජිකයින් මත ගෝත්‍රික ආධිපත්‍යය
(4) ගෝත්‍රයට විශ්වාසවන්තවීම
(5) ප්‍රතිපත්ති මත වූ සබඳතාව

19. පවුලේ නායකත්වය පිළිබඳ ඉස්ලාමයේ දැක්මට අනුව නායකත්වය,

(1) පියාට පමණක් හිමිවේ.
(2) මවට හිමිවේ.
(3) පියාට අයත් වේ, එනමුත් මවට ද වගකීම් ඇත.
(4) පවුලේ සාමාජික සාමාජිකාවන් සියල්ලන්ට හිමිවේ.
(5) ආර්ථික සහාය සපයන්නාට හිමිවේ.

Past Papers Wiki



**20.** පහත ඒවා අතුරෙන්, ෂරීආ පිළිබඳ අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) එය මිනිස් චර්යා පාලනය කර සකස් කරන පිළිවෙත වේ.
(2) එය මුළුමනත් වශයෙන් සියලු ම ක්ෂේත්‍ර මත බලපෑම් ඇති කරයි.
(3) එහි විශ්වාස, මූලධර්ම, නීතිය, සංස්කෘතිය ආදී සියල්ල අඩංගු වේ.
(4) එය කාල හෝ දේශ වෙනස්කම් අනුව නොවෙනස්වන ස්ථාවරයක් සහිත මගපෙන්වීමකි.
(5) එය මිනිස් ජීවිතයේ සියලු ම චර්යාවලදී අල්ලාහ්ගේ කැමැත්ත වේ.

**21.** කිලාෆත් රාෂිදා පාලනය යටතේ තිබූ ප්‍රධාන නගරවලින් එකක් වන්නේ,
(1) බග්ඩෑඩ් ය. (2) ඉස්තාන්බූල් ය.
(3) ලාහූර් ය. (4) බුස්තාද් ය.
(5) සිසිලි ය.

**22.** අකබා ගිවිසුමෙහි ප්‍රධාන රීතිය **නොවන්නේ**,
(1) ප්‍රතිපත්තිමය බැඳීම ය.
(2) සදාචාරය හා චාරිත්‍ර ය.
(3) නායකත්ව ආරක්ෂාව ය.
(4) එක්සත් සමාජයක් ලෙස ජීවත් වීමේ පොරොන්දුව ය.
(5) කුරෙෂ්වරුන්ගේ ආධිපත්‍යය ය.

**23.** පහත ඒවා අතුරෙන්, 'අසීරුබව නීතිය ලිහිල් කරයි' යන ෂරීආ රීතිය හඳුන්වන යෙදුම වන්නේ,
(1) අල්යකීනු ලා යසීලු බිෂ්ෂක් ය.
(2) අල් උමූරු බිමකාසිදිහා ය.
(3) අල් ආදාතු මුහක්කමා ය.
(4) අල් ලරරු යුසාලු ය.
(5) අල් මෂක්කතු තජ්ලිබුත් තෛසීර් ය.

**24.** උමෙයා කිලාෆතයෙහි සැබෑ නිර්මාතෘ ලෙස ප්‍රශංසාවට ලක්වූ පාලකයා වන්නේ,
(1) අබ්දුල් මලික් බින් මර්වාන් ය.
(2) වලීද් බින් අබ්දුල් මලික් ය.
(3) උමර් බින් අබ්දුල් අසීස් ය.
(4) යසීද් බින් මුආවියා ය.
(5) හජ්ජාජ් බින් යූසුෆ් ය.

**25.** ශීආ චින්තනය තහවුරු කිරීමට ස්ථාපිත කුඩා රාජ්‍යය වන්නේ,
(1) කස්නවි ය. (2) සෙල්ජූක් ය. (3) අයියූබි ය.
(4) බුවෛහිද් ය. (5) ෆාතිමි ය.

- පහත සඳහන් පුද්ගලයින් තජ්දීද් කාර්යයෙහි නිරත වූ වැදගත් මහා පුරුෂයන් වේ. ඔවුන්ට අදාළව අංක **26** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - උමර් බින් අබ්දුල් අසීස් (රහ්)
B - මුහම්මද් බින් අබ්දුල් වහ්හාබ් (රහ්)
C - අබ්දුල් කාදර් ජීලානි (රහ්)
D - ඉමාම් හසනුල් බසරි (රහ්)
E - ඉමාම් ගස්සාලි (රහ්)
F - ජමාලුද්දීන් ආෆ්ගානි (රහ්)
G - මුහම්මද් අබ්දුහු (රහ්)
H - ෂේක් අහමද් සිර්හින්දි (රහ්)
I - ඉමාම් හසනුල් බන්නා (රහ්)
J - රෂීද් රිලා (රහ්)
K - මව්ලානා ඉල්යාස් (රහ්)
L - ඉමාම් ඉබ්නු තෛමියියා (රහ්)
M - ෂාහ් වලියුල්ලාහ් (රහ්)
N - මව්ලානා මෑදූදි (රහ්)
O - බදිඋස්සමාන් සර්ද් නූර්සි (රහ්)

**26.** ක්‍රි. ව. 19 වන සියවසේ තජ්දීද් කාර්යයට දායක වූවන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) B, C, D (2) C, N, F (3) D, K, L (4) E, G, J (5) F, G, N

[පස්වැනි පිටුව බලන්න.

27. ඉන්දියාවෙහි ඉස්ලාමීය පුනරුදයට දායක වූවන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) E, I, O (2) F, M, O (3) G, B, C (4) H, K, M (5) I, K, N

28. නූතන යුගයේ ඉස්ලාමීය සංවිධාන බිහි කළ අය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) E, H, M (2) F, I, N (3) G, E, B (4) H, F, O (5) I, K, N

29. තසව්වුෆ් පිළිවෙත පාදක කර ගනිමින් ප්‍රතිසංස්කරණ කාර්යයන් සිදු කළ අය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) B, F, J (2) C, E, O (3) E, I, L (4) F, C, O (5) G, J, M

30. පාරිශුද්ධ අකීදාව රැකගැනීමට දායක වූ අය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) B, H, L (2) C, E, J (3) D, G, N (4) E, C, I (5) F, K, O

31. පහත කරුණු සලකන්න.
A - දෙලොවෙහි යහපත උදෙසා උදව් කිරීම
B - සුවදුක්වල දී සහභාගිවීම
C - එකට මුසු වී සම්බන්ධ වී ජීවත්වීම
D - සන්නිවේදන ඇති කරගැනීම
E - ආරාධනා පිළිගෙන ඒවාට ගරුකර කටයුතු කිරීම
F - අයිතිවාසිකම් රැකීම

ඉහත කරුණු අතුරෙන්, කෙනෙකු තම අසල්වැසියන් සමග සුහද ව කටයුතු කිරීමට පිළිපැදිය යුතු ඉස්ලාමීය පිළිවෙත් පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) A, B, C, E, F (2) B, C, D, A, E (3) C, B, A, E, F
(4) D, B, F, E, A (5) E, C, A, F, D

32. "නියත වශයෙන් කාලයක් පැමිණෙනු ඇත. එකල ස්ත්‍රියක් බියෙන් තොරව සන්ආ හි සිට හලරමවිත් තෙක් තනියෙන්ම ගමන්කරනු ඇත." මෙම නබි වදන මගින් හැඟවෙන්නේ
(1) මහාමාර්ග පහසුකම්වල දියුණුව වේ.
(2) අරාබියාවෙහි ආර්ථික සංවර්ධනය වේ.
(3) කාන්තාවන්ට ආරක්ෂාව සහිත යහපාලනය වේ.
(4) ගෝලීයකරණය වේ.
(5) ප්‍රවාහන මාර්ගවල වර්ධනය වේ.

33. පහත වගුවෙහි සපයා ඇති තොරතුරු සලකන්න.

| අල්කුර්ආන් වාක්‍ය | හුවාදක්වන කරුණ |
|---|---|
| (i) අප ආදම්ගේ පරම්පරාවට ගරුත්වය ලබාදී ඇත්තෙමු. | A - විවිධත්වය |
| (ii) ආගමෙහි බලකිරීමක් නොමැත. | B - පොදු යුක්තිය |
| (iii) ඔබලාගේ භාෂා හා වර්ණ වෙනස්ව පැවැතීම ද ඔහුගේ සාක්ෂි වේ. | C - මානව ගෞරවය |
| (iv) ඔබගේ රක්ෂකයා සිතා තිබුණි නම් සියලු ම ජනයා එකම සමූහයක් ලෙසට පත්කරන්නට තිබුණි. | D - බහු සංස්කෘතිය |
| (v) ඔබ වංචාකරුවන් වෙනුවෙන් තර්ක කරන කෙනෙකු නොවන්න. | E - ආගමික නිදහස |

ඉහත වගුවෙහි දැක්වෙන අල් කුර්ආන් වාක්‍ය මගින් හුවා දක්වන කරුණ සමග නිවැරදිව ගැළපෙන අනුපිළිවෙළ සඳහන් වරණය තෝරන්න.
(1) A, D, E, B, C (2) B, E, D, C, A (3) C, E, D, A, B
(4) D, C, E, B, A (5) E, A, B, C, D

34. පහත ඒවා අතුරෙන් මුස්තහබ් වන කාර්යයන් අඩංගු කොටස වන්නේ,
(1) හාජියාත් ය. (2) ලරූරියියාත් ය. (3) මුබාහාත් ය.
(4) මුන්කරාත් ය. (5) මඃරූෆාත් ය.

**35.** අබ්බාසිය පාලනයේ දී බලවත් ප්‍රධාන අමාත්‍ය ලෙස කටයුතු කළේ,
(1) යහ්යා බර්මකි ය.
(2) නිසාමුල් මුල්ක් තූසි ය.
(3) අබූ මුස්ලිම් අල්කුරාසානි ය.
(4) නජ්මුද්දීන් අයියුබි ය.
(5) බද්රුල් ජමාලි ය.

**36.** මක්කාව මධ්‍යස්ථාන කරගෙන පැවති තෆ්සීර් පන්තියේ ප්‍රධානියා වූ සහාබිවරයා වන්නේ,
(1) උබෙයි බින් කඃබ් (රලි) ය.
(2) අබ්දුල්ලා බින් අබ්බාස් (රලි) ය.
(3) අබ්දුල්ලා බින් මස්ඌද් (රලි) ය.
(4) අබ්දුල්ලා බින් උමර් (රලි) ය.
(5) සෙයිද් බින් දාබිත් (රලි) ය.

**37.** කුතුබුල් මිනාර් නිර්මාණය කරවූ මෝගල් රජු වන්නේ,
(1) ඖරංගසීබ් ය.
(2) හුමායූන් ය.
(3) ෂාජහාන් ය.
(4) කුතුබුද්දීන් අයිබක් ය.
(5) සුල්තාන් තෛමූර් ය.

**38.** සූෆි චින්තනය පාදකව ඇති වූ තෆ්සීර්වලට අදාළ පූර්ව ග්‍රන්ථය වන්නේ
(1) තෆ්සීර් ජලාලෛන් ය.
(2) අල් බහ්රුල් මුහීත් ය.
(3) හකාඉකුත් තෆ්සීර් ය.
(4) මෆාතිහුල් ගෛබ් ය.
(5) ෆී ළිලාලිල් කුර්ආන් ය.

**39.** ක්‍රි. පූ. 4 වන සියවසට පෙර අරාබි වෙළෙඳ ජනාවාස ලංකාවේ තිබූ බව දක්වන ඓතිහාසික සාහිත්‍ය ග්‍රන්ථය වන්නේ,
(1) Ceylon in Ptolemy's Geography
(2) Muslims of Sri Lanka: Avenues to Antiquity
(3) History of Ceylon
(4) Ceylon of James Tennent
(5) The Preaching of Islam

**40.** පහත හදීස් වර්ග අතරෙන් අල්කුර්ආනයට පසුව ඊළඟට ඉහළ තත්ත්වය සහිත වර්ගය වන්නේ,
(1) හදීස් අල් කුද්සි ය.
(2) හදීස් මෂ්හූර් ය.
(3) මුත්තෆකුන් අලෛහි ය.
(4) හදීස් මුතවාතිර් ය.
(5) හදීස් මර්ෆූඃ ය.

**41.** දැනුම හා අධ්‍යයනය උපරිමව යොදාගත් ඉජ්තිහාද් වර්ගය වන්නේ,
(1) අල් ඉජ්තිහාද් අල් ඉන්තිකාඉ ය.
(2) අල් ඉජ්තිහාද් අන්නාකිස් ය.
(3) අල් ඉජ්තිහාද් අල් ඉන්ෂාඉ ය.
(4) අල් ඉජ්තිහාද් අල් ජුස්ඉ ය.
(5) අල් ඉජ්තිහාද් අල් මුකයියද් ය.

**42.** ගමනකදී ජලය නොලැබීම නිසා තයම්මුම් කර සලාතය ඉටු කළ සහාබාවරුන් දෙදෙනා අතුරෙන් ජලය ලැබුණු විට දී එම සලාතය නැවත ඉටු නොකළ සහාබාවරයා පිළිබඳ නබි (සල්) තුමාණන්ගේ ප්‍රකාශය වූයේ එය,
(1) සුන්නාවට පටහැනිය යන්නය.
(2) සලාතය ඉටුවී සුන්නා ක්‍රියාත්මක කෙරිණි යන්නය.
(3) වැරදි ඉජ්තිහාදයකි යන්නය.
(4) නැවත සලාතය ඉටු කළ යුතුව තිබුණි යන්නය.
(5) ආනිසංශ දෙකක් ලැබේ යන්නය.

**43.** පහත ඒවා අතරෙන් ෆික්හ් ක්ෂේත්‍රයේ වර්ධනයට දායක වූ කරුණ වන්නේ,
(1) මිනිසාගේ අදහස්, නිර්මාණ වේ.
(2) ඉජ්තිහාද් වේ.
(3) දේශපාලන බලය වේ.
(4) සමාජ විපර්යාසය වේ.
(5) ආර්ථික දියුණුව වේ.

**44.** මද්හබ් සහාබි යන්නෙන් දක්වන්නේ
(1) කව්ලුස්සහාබි ය.
(2) මද්හබ් ෂාෆිඊ ය.
(3) ඉජ්මාඋල් සුකූති ය.
(4) ඉජ්තිහාද් මුත්ලක් ය.
(5) ෂරුඋස් සාබික් ය.

**45.** ඔස්ලර් (Osler) නම් විද්වතා විසින් වෛද්‍ය ක්ෂේත්‍රයේ බයිබලය ලෙස දැක්වූ ග්‍රන්ථය වන්නේ,
(1) කානූන් ය.
(2) අල්-හාවි ය.
(3) කිතාබුල් ජුදරි වල් හස්බාහ් ය.
(4) කිතාබුල් මාලිකි ය.
(5) අත්තෆ්සීර් ය.

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් සපයා ඇත. එම එක් එක් ප්‍රකාශ යුගලයට අදාළ ඉතා ගැළපෙන සම්බන්ධතාව දක්වන නිවැරදි පිළිතුර වගුවෙහි අංක (1), (2), (3), (4), (5) අතුරෙන් තෝරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදිය. |
| (2) | වැරදි ය. | නිවැරදිය. |
| (3) | නිවැරදි ය. | වැරදිය. |
| (4) | වැරදි ය. | වැරදිය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | මුඃතසිලා කොටසට අයත් අය අහ්ලුස්සුන්නා වල් ජමාඅතයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස් වූ අය වේ. | මුඃතසිලා කොටසට අයත් අය අතර ප්‍රතිපත්තිමය වශයෙන් අභ්‍යන්තර කොටස් රාශියක් ඇත. |
| **47.** | පුරාණ ලාංකේය මුස්ලිම්වරුන් අභ්‍යන්තර වෙළෙඳාම තම පාලනය යටතේ තබාගත්හ. | පෘතුගීසින්ගේ කාලයේ ලාංකේය මුස්ලිම්වරුන් ස්වාධීනව වෙළෙඳාමෙහි යෙදුනහ. |
| **48.** | අබ්බාසිය පාලන යුගයේදී ජනවාර්ගික කණ්ඩායම්වල බලපෑම කුඩා රාජ්‍ය බිහිවීමට හේතු වුනි. | අයියූබිවරුන් කුරුස සටන්කරුවන්ට එරෙහිව සටන් වැදුනහ. |
| **49.** | හුස්ම පාලනය කර භාවනා කිරීම, මනස පාරිශුද්ධ කිරීමේ හා රක්ෂිතයානන් සමග සම්බන්ධතාව වැඩිදියුණු කිරීම ඉස්ලාමීය පිළිවෙත වේ. | ශරීරය ශක්තිමත් කරන ක්‍රීඩා, ව්‍යායාම් ආදියෙහි යෙදීම ඉස්ලාමයෙන් අවධාරණය කළ දෙයක් නොවේ. |
| **50.** | ප්‍රතිපත්තිමය නිදහස හා ආගම් තේරීම දේව ප්‍රතික්ෂේපය ශක්තිමත් කරයි. | විවිධ ආගමික පිරිස් අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කරගැනීම මගින් ඉවසාදරාගැනීමේ හැකියාව පෙන්නුම් කරයි. |

* * *

Past Papers Wiki

 0071

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ I **කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, II **කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) අල් කුර්ආනයේ සඳහන් ව ඇති ඉබාරතුන් නස් හා ඉෂාරතුන් නස් නීතිවලට අදාළ නිදසුන් **දෙක බැගින්** ලියන්න.
   (ii) 'හදීස් ඉස්ලාම්හි දෙවන නීති මූලාශ්‍රය වේ' යන්න තහවුරු කරන අල් කුර්ආන් හා අල් හදීස් සාක්ෂි **හතරක්** දක්වන්න.
   (iii) ඉජ්තිහාද් වර්ග අතරින් **හතරක්** දක්වන්න.
   (iv) තබඋත් තාබිඊන් කාලයේ අල් කුර්ආන් විවරණවලදී සැලකිල්ලට ගත් කරුණු **හතර** විස්තර කරන්න.
   (v) තනිපුද්ගලයින් සමාජයට සම්බන්ධ කිරීමට නබි (සල්) තුමාණන් නිර්දේශ කළ කරුණු **හතරක්** දක්වන්න.
   (ලකුණු 04 × 5 = 20 යි)

2. (i) ජාහිලියියා සමයේ පරිපාලන පිළිවෙත් **හතරක්** පැහැදිලි කරන්න.
   (ii) නුබුව්වතයට පෙර නබි (සල්) තුමාණන්ගේ නායකත්ව ලක්ෂණ පිළිබිඹු වූ ක්‍රියාවන් **හතරක්** විස්තර කරන්න.
   (iii) කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ තෝරාගැනීම්වල අනුගමනය කරන ලද පිළිවෙත් **හතර** විස්තර කරන්න.
   (iv) කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්) තුමාණන් ප්‍රධාන මුජද්දිද් ලෙස සැලකීමට සාධාරණ හේතු **හතරක්** දක්වන්න.
   (v) නගර සංවර්ධනය උදෙසා අබ්බාසීය යුගයේ ඉටු වූ කාර්යයන් **හතරක්** විස්තර කරන්න.
   (ලකුණු 04 × 5 = 20 යි)

3. (i) ලංකාව හා මැදපෙරදිග ප්‍රදේශය අතර ඉපැරණි සම්බන්ධයට අදාළ සාධක **හතරක්** දක්වන්න.
   (ii) ලංකාවේ මුස්ලිම්වරුන් නිදහසට පෙර සංස්කෘතිය සහ සම්ප්‍රදාය උදෙසා දායකත්වය දැක්වූ කාර්යයන් **හතරක්** සඳහන් කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් වෙළෙඳ සමාජයක් ලෙස හැඳින්වීමට හේතු වූ කරුණු **හතරක්** දක්වන්න.
   (iv) අනෙකුත් සමාජ සමග ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් සම්මිශ්‍රව කටයුතු කිරීමට අදාළ ඉස්ලාමීය මගපෙන්වීම් **හතරක්** පැහැදිලි කරන්න.
   (v) ඔබේ අදහසට අනුව ලංකාවේ පවුල් සංස්ථාවේ ව්‍යූහය රැකීමෙහිලා මුස්ලිම් කාන්තාවන්ගේ භූමිකා **හතරක්** පැහැදිලි කරන්න.
   (ලකුණු 04 × 5 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

4. (i) නබි (සල්) තුමාණන් මදීනා හි ඉස්ලාමීය රාජ්‍යයක් බිහිකිරීමේ අරමුණින්, මක්කම කාල ජීවිතයේදි සිදුකළ කටයුතු **පහක්** පැහැදිලි කරන්න.

(ii) “කිලාෆා රාෂිදා යුගයේ පරිපාලන ක්‍රම ආදර්ශමත් දේශපාලනයට කදිම නිදසුනකි.” එම යුගයේ පරිපාලන කටයුතු **පහක්** සඳහන් කර පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

5. (i) උමෙයා කලීෆාවරුන්ගේ ප්‍රධාන දායකත්ව **පහක්** පැහැදිලි කරන්න.

(ii) සෙල්ජුක් නම් කුඩා රාජ්‍යයේ අධ්‍යාපන, සංස්කෘතික දායකත්වය ගෙනහැර දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

6. (i) වෛද්‍ය ක්ෂේත්‍රයෙහි වර්ධනයට මුස්ලිම්වරුන් ඉටු කළ කාර්යභාර **පහක්** සඳහන් කර විස්තර කරන්න.

(ii) සංගීත කලාව පිළිබඳ ඉස්ලාමයේ ස්ථාවරය හා මුස්ලිම් ඉතිහාසයේ එම කලාවෙහි වර්ධනය විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

7. (i) ඉස්ලාමීය ශිෂ්ටාචාරයේ ඇණ හිටීමට හේතු සාධක **දහයක්** ලැයිස්තු ගත කරන්න.

(ii) මව්ලානා ඉල්යාස් (රහ්) සහ මව්ලානා මව්දූදි (රහ්) යන දෙදෙනාගේ සමාජ පුනරුද සේවාව සංසන්දනය කර පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

8. (i) ‘මකාසිදුෂ්ෂරීආ’ යන්න ෂරීආ නීතිවල පරමාදර්ශ හා මූලධර්ම ඉදිරිපත් කිරීම වේ. මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

(ii) ‘ෂීආ’, දේශපාලන අංශයක් ආකාරයෙන් බිහි වී පසුව ප්‍රතිපත්තිමය සංවිධානයක් වශයෙන් වර්ධනය වූවක් වශයෙන් එහි චින්තනයන් පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library